රජයේ නිවේදන

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

**3 වැනි වගන්තිය යටතේ නියමය**

සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින් මෙහි උපලේඛනයෙහි I, II හා III වන තීරුවල නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති සෑම අනුරූපී භාණ්ඩයක් මතම, ඉහත පනතේ 3 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද 2019 මැයි මස 13 දිනැති අංක 2123/5 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය, 2019 ජූලි මස 10 දිනැති අංක 2131/29 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය සහ 2019 ඔක්තෝබර් මස 14 දිනැති අංක 2145/12 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත 2019 මාර්තු මස 05 දිනැති අංක 2113/9 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයේ I වන උපලේඛනයෙහි අනුරූප භාණ්ඩ මත එම උපලේඛනයේ IV වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති බදු අනුප්‍රමාණයන් සඳහා, මෙහි උපලේඛනයෙහි IV වැනි තීරුවෙහි දක්වා ඇති නිෂ්පාදන බදු අනුප්‍රමාණයන් 2019 දෙසැම්බර් මස …01…. දින සිට ප්‍රතිස්ථාපනය විය යුතු බව, ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2019 දෙසැම්බර් මස ..01.. වැනි දින,
කොළඹ 01,
ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය *I* | සංයෝජිත වර්ගීකරණ සංකේතය *II* | විස්තරය *(III)* | නිෂ්පාදන බද්ද *(IV)* |
|---|---|---|---|
| **24.02** | | **දුම්කොළ වලින් හෝ දුම්කොළ ආදේශක වලින් නිෂ්පාදිත සුරුට්ටු, කට තබන පැත්ත උල්වූ සුරුට්ටු, සිගාරිලෝස් සහ සිගරැට්.** | |
| | 2402.20 | දුම්කොළ අඩංගු සිගරැට්: | |
| | 2402.20.20 | දිග මි.මී. 60 ට නොවැඩි සිගරැට් | සිගරැට් 1,000 ට රු. 13,360/- |
| | 2402.20.30 | දිග මි.මී. 60 ට වැඩි නමුත් දිග මි.මී. 67 ට නොවැඩි සිගරැට් | සිගරැට් 1,000 ට රු. 22,300/- |
| | 2402.20.40 | දිග මි.මී. 67 ට වැඩි නමුත් දිග මි.මී. 72 ට නොවැඩි සිගරැට් | සිගරැට් 1,000 ට රු. 37,650/- |
| | 2402.20.50 | දිග මි.මී. 72 ට වැඩි නමුත් දිග මි.මී. 84 ට නොවැඩි සිගරැට් | සිගරැට් 1,000 ට රු. 43,100/- |
| | 2402.20.60 | දිග මි.මී. 84 ට වැඩි සිගරැට් | සිගරැට් 1,000 ට රු. 48,350/- |

# Government Notifications

**Excise (Special Provisions) Act, No.13 of 1989**

**Order under Section 3**

BY virtue of the powers vested in me by Section 3 of the Excise (Special Provisions) Act, No. 13 of 1989, as amended, I, Mahinda Rajapaksa, Minister of Finance, Economy and Policy Development, do by this Order declare that, the rate of Excise duty specified in the Column IV applicable on corresponding articles specified in Column I, II and III of the Schedule hereto, shall replace the rate specified in Column IV on the corresponding articles of the Schedule I of the *Extraoridinay Gazette* Notification No. 2113/9 dated March 05, 2019 as amended by the Extraoridinay Gazette Notification Nos. 2123/5 dated May 13, 2019, 2131/29 dated July 10, 2019 and 2145/12 dated October 14, 2019 issued under the Section 3 of this Act with effect from December …01…, 2019

Sgd MAHINDA RAJAPAKSA,
Minister of Finance, Economy and Policy Development.

Ministry of Finance, Economy and Policy Development,
Colombo 01,

December …01.., 2019.

## Schedule

| *HS Hdg.* *I* | *HS Code* *II* | *Description* *III* | *Excise Duty* *IV* |
|---|---|---|---|
| **24.02** | | **Cigars, cheroots, cigarillos and cigarettes, of tobacco or of tobacco substitutes.** | |
| | 2402.20 | Cigarettes containing tobacco : | |
| | 2402.20.20 | Cigarettes, each not exceeding 60 mm in length | Rs.13,360/- per 1000 cigarettes |
| | 2402.20.30 | Cigarettes, each exceeding 60 mm but not exceeding 67 mm in length | Rs. 22,300/- per 1000 cigarettes |
| | 2402.20.40 | Cigarettes, each exceeding 67 mm but not exceeding 72 mm in length | Rs. 37,650/- per 1000 cigarettes |
| | 2402.20.50 | Cigarettes, each exceeding 72 mm but not exceeding 84 mm in length | Rs. 43,100/- per 1000 cigarettes |
| | 2402.20.60 | Cigarettes, each exceeding 84 mm in length | Rs. 48,350/- per 1000 cigarettes |